258, එම්. වින්සන්ට් පෙරේරා මාවත

කොළඹ 14

011 470 0800

# යුනිලිවර් VIVA, පවුල් 500කට වැඩි පිරිසකට අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කරයි

ගතවන අභියෝගාත්මක කාලයේ අතහිත අවැසි ප්‍රජාවන්ට සහන සැලසීමට පියවර ගනියි

**2022, මැයි 24, කොළඹ.** යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ මෝල්ට් සහිත ආහාරමය පාන සන්නාමයක් වන VIVA, දඹාන ප්‍රදේශයේ පවුල් 500 කට අධික ප්‍රමාණයක් වෙත වියළි සළාක හා යුනිලිවර් නිෂ්පාදන පරිත්‍යාග කිරීමට කටයුතු කරන ලදී. ස්වර්ණවාහිනී නාලිකාව හා අත්වැල් බැඳ ගනිමින් අවුරුදු වැඩසටහනට සමගාමීව එම සුවිශේෂී පරිත්‍යාගයන් සිදු කිරීම විශේෂත්වයකි.

දෛනික ආහාර වේලෙහි හා ව්‍යායාම සැලැස්මෙහි කොටසක් ලෙස භාවිතයට ගනු ලබන VIVA සතු ඉහළ උකු ගතිය හා මෝල්ට් රසය මඟින් සෑම තේ කෝප්පයක්ම රසවත් තේ කෝප්පයක් බවට පත් කරනු ලබයි. VIVA දෛනික පරිභෝජන ප්‍රමාණය මඟින් විටමින් B1, B2, B3, විටමින් C, කැල්සියම්, යකඩ හා පොස්පරස්වල දෛනික අවශ්‍යතාවයටද දායක වන අතර පවුලටම ශක්තිය සැපයීමටද උපකාරී වේ.

වර්තමානයේ ජනතාව මුහුණ දෙන අභියෝගාත්මක වාතාවරණය තුළ ආර්ථික වශයෙන් අපහසුතාවයන්ට මුහුණ දෙන ප්‍රජාවන්ට උපකාර කිරීම අරමුණු කර ගනිමින් VIVA, 'පිරිපුන් රස අවුරුද්දක්' වැඩසටහන දියත් කරන ලදී. ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිල ඇත්තොගේ ආශිර්වාදය ලබා ගනිමින් දඹාන ප්‍රාථමික විද්‍යාලයේදී පැවති හමුවකදී ප්‍රදේශයේ පවුල් 500කට අධික පිරිසක් වෙත වියළි සළාක හා යුනිලිවර් නිෂ්පාදන බෙදා දීමට මෙහිදී VIVA කටයුතු කරන ලදී.

මෙම සුවිශේෂී සත්කාරක වැඩසටහන සම්බන්ධයෙන් අදහස් දැක්වූ **යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ Unilever Food Solutions** හා **Nutrition යන අංශවල ප්‍රධානී මිලින්ද වීරසිංහ මහතා** සඳහන් කර සිටියේ *''පරම්පරා ගණනාවක් තිස්සේ ශ්‍රී ලාංකිකයන් පෝෂණය කළ VIVA සෑම විටම පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් සියලු දේ සිදු කරමින් පවුලේ වෙළෙඳ නාමයක් බවට පත්ව තිබෙන බව රහසක් නොවෙයි. ඒ නිසාම පවතින වාතාවරණය හමුවේ නොයෙකුත් බාධක වලට මුහුණ දෙන අපේම ප්‍රජාවට සහනයක් වන්නටත් ඔවුන්ගේ පවුලේ සතුට හා එකමුතුකම වැඩිවර්ධනය කරන්නට හේතුවක් වන්නටත් අප මෙම වැඩසටහන සංවිධානය කරන්නට කටයුතු කලා. ඒ වගේම ස්වර්ණවාහිනිය සමග අත්වැල් බැඳ ගනිමින් ඒ සුවිශේෂී අවස්ථාව තව තවත් වර්ණවත් කිරීමේ අවුරුදු වැඩසටහන දඹාන ජනතාවට ලබා දීමට හැකිවීම අප ලද භාග්‍යයක් කොට සැලකීමට කැමතියි''* යනුවෙනි.

මෙම අවස්ථාව සඳහා යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ Unilever Food Solutions හා Nutrition යන අංශවල ප්‍රධානී මිලින්ද වීරසිංහ, මාධ්‍ය හා මෙහෙයුම් ප්‍රධානී චන්න තෙන්නකෝන් යන මහත්වරුන් මෙන්ම Unilever, Mindshare හා Wings Brand Activations ආයතන වල නියෝජිතයන් මෙන්ම ජනප්‍රිය නළු නිළියන් රැසක් ද එක්ව සිටියහ.